**ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1 වගුවට ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 01 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2018 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ශිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.2.1 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.10 |
| | | 4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 (ආ) |
| | | 5. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන | ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.2(ඇ) |

| | | | |
|---|---|---|---|
| | මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7<br>2.8 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.3.1 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.1.3 |

| | | | |
|---|---|---|---|
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | ආදායම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 (අ) |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | 1. ආදායම් ගිණුම්වල වූ අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.7(අ)<br>2.8(අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරිම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | වියාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.2(ඇ) |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳි සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් | 1. විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |

| | | | |
|---|---|---|---|
| | මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව (මු.රෙ.150 බලන්න) | | |

**මුදල් රෙගුලාසි 128(2) - රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

| | | | |
|---|---|---|---|
| 128(2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම | 1. අපේක්ෂිත ආදායම රැස්කිරිමට නොහැකිවීම/ රැස්කළ හැකි ආදායම වැඩිවීමකදී හෝ අඩුවීමකදී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරිමට පියවර නොගැනීම. | 2.7 |
| 128(2)(ඇ) | ආදායම් සංකේතයට අදාළව මුදල් වර්ෂයේ ජුනි 30 දිනට හා දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් තත්ත්වය පෙන්නුම් කරන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම. (මෙම වාර්තාව පිළිවෙලින් ජුලි 31 දින හා ජනවාරි 31 දිනට කලින් විගණකාධිපති වෙත ලැබිය යුතුය. පිටපතක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.) | අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා නියමිත දිනයට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2.7 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**------------------------------------------------**

**2.1 කාර්යසාධනය**

**----------------**

**2.1.1 සැලැසුම් කිරීම**

**---------------**

සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 06 ක් පැවැති අතර, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත එක් කාර්යයක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එම කාර්යයන් ඉටුකිරීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන්, සියයට 20 ක් ඉතිරි කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල ඇස්තමේන්තු කර, සඳහන් කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් කාර්යභාරයන් 21 ක් ඉටු කළ යුතුව තිබුණු අතර ඉන් කාර්යභාරයන් 20 ක් ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ක්‍රියාකාරී සැලැස්ම අනුව කුඩා හා මධ්‍ය පරිමාණ මත්ස්‍ය කර්මාන්තය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම යටතේ සූර්යය බලශක්ති ඒකක ලබාදීම සඳහා රු.මිලියන 80.1 ක ප්‍රතිපාදන ලබාදී එම කාර්යභාරය ඉටු කිරීමෙන් සියයට සියයක ප්‍රතිඵලය අත්පත් කර ගැනීමට (Output) අපේක්ෂා කර තිබුණත්, ප්‍රසම්පාදනයන් සැලැසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකිවීම නිසා රු.මිලියන 80.1 ක ප්‍රතිපාදනය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

ii. ක්‍රියාකාරී සැලැස්මෙහි ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ දිස්ත්‍රික් ධීවර කාර්යාල 07 ක් අලුත්වැඩියාවට රු.මිලියන 15 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණත්, සැලසුම් නොකළ කාර්යයන් 3 ක් ඉටුකර ඒ සඳහා රු.මිලියන 2.7 ක් වැය කිරීම හේතුවෙන් සැලැසුම්කර තිබූ මීගමුව හා කල්මුණේ දිස්ත්‍රික් ධීවර කාර්යාල අලුත්වැඩියාව සිදුකර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

-------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කාර්යභාරයන් 06 ක් යටතේ ක්‍රියාකාරකම් 32 ක් සඳහා රු.මිලියන 431.2 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, එම කාර්යයන්වල කාර්යසාධක දර්ශක සඳහන් කර නොතිබුණු නිසා කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

------------------------------

2017 ජනවාරි 01 දින ආරම්භ කර 2017 නොවැම්බර් 30 දින අවසන් කළ යුතු නව තාක්ෂණය හඳුන්වාදීම හා ට්‍රාන්ස්පොන්ඩර් සහ සූර්ය කෝෂ ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණු රු. මිලියන 500 ක ප්‍රතිපාදනවලින් 2017 දෙසැම්බර් 31 දින වන විට

රු. මිලියන 343 ක් වැය කර තිබුණ ද 2018 අගෝස්තු 31 දින වන විටත් එම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 90.55 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 68.30 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීමේ දී පුනරාවර්තන වැය යටතේ වන ප්‍රසම්පාදනයන් ඇතුළත් නොකර මූලධන වැය යටතේ වන ප්‍රසම්පාදනයන් පමණක් ඇතුළත් කර තිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

(අ) ධීවර වරාය නිලධාරීන් හා ධීවරයින්ට නව තාක්ෂණය හඳුන්වාදීම යටතේ එකක් රු.79,000 ක් බැගින් විද්‍යුත් ටැබ්ලට් 2328 ක් මිලදී ගැනීමට රු.183,912,000 ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 (ආ) ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටුවට විශේෂඥයෙකු සහභාගී වී නොතිබුණි. විද්‍යුත් ටැබ්ලට් 2328 න් 1816 ක් 2018 ජූනි 10 දින වන විටත් බෙදාහැර නොතිබුණි. මෙම විද්‍යුත් ටැබ්ලට් භාවිතය පිළිබඳ ධීවරයින් දැනුවත් කර, පුහුණුවක් ලබා නොදීම හේතුවෙන්, බෝහෝ ධීවර කාර්මිකයින් මෙම විද්‍යුත් ටැබ්ලට් භාර ගැනීමට හා භාවිතයට මැලිකමක් දක්වන බව නිරීක්ෂණය විය. මේ අනුව ටැබ්ලට් මිල දී ගැනීමේ අරමුණු ඉෂ්ට වී නොතිබුණි.

(ආ) ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදනය යටතේ මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ උම්බලකඩ සකස් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිලාභීන් 76 කට බෙදා දීම සඳහා පයිබග්ලාස් මාළු පෙට්ටි 304 ක් සහ ලෝහ හට්ටි 76 ක් ඇතුළු උපකරණ මිල දී ගැනීමට රු. මිලියන 4.34 ක් වැය කර තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (අ), 2.12, 4.2.2 (අ) හා 8.9.1 මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3 වත්කම් කළමනාකරණය

**දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩු පාඩු නිරීක්ෂණය විය.**

## 2.3.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2018 ඔක්තෝබර් 26 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් 2016 වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණි.

(ii) 2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.4 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.8.1 | ඉන්ධන මිල වැඩිවීම හේතුවෙන් ධීවර යාත්‍රා හිමියන්ට සහනාධාරයක් ලෙස ඉන්ධන ලබාදීමේ වැඩසටහන වෙනුවෙන් එකතුව රු. මිලියන 4,550 ක් මහා භාණ්ඩාගාරය මඟින් වැය කර තිබුණි. ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ තොරතුරු අනුව සපයා තිබුණු ඉන්ධන වල වටිනාකම රු. මිලියන 4,374 ක් විය. භාණ්ඩාගාර බැඳුම්කරයක් මඟින් ගෙවා ඇති රු. මිලියන 4,330 ක මුදල වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට පොලී මුදල් ගෙවනු ලබන බැවින් වැඩිපුර ගෙවන ලද රු. මිලියන 176 වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වාර්ෂිකව ගෙවනු ලබන පොළී මුදල ද රජයට සිදුවන අලාභයක් විය. |
| 2016 | 3.7 | 2016 බොට්ටු 10 ක් නිපදවීමට රු.මිලියන 149. 8 ක් ගෙවා තිබුණද, බෝට්ටු 5 ක් 2018 සැප්තැම්බර් වන විටත්, නිම කර ලබා දී නොතිබුණි. |

## 2.5 කළමනාකරණ දූර්වලතා

2017 දෙසැම්බර් 31 දිනට ට්‍රාන්ස්පෝන්ඩර් සහිත බහුදින යාත්‍රා 378 ක් අක්‍රීය වී තිබුණු අතර 57 ක් ජාත්‍යන්තර මුහුදු සීමා උල්ලංඝණය කර තිබුණි. අක්‍රීය වී තිබූ යාත්‍රා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු සලසා නොතිබුණි.

**2.6** **කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---

**විසර්ජන ගිණුම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අමාත්‍යාංශය ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් විවිධ කාර්යයන් සඳහා රු. මිලියන 24.6 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 6.51 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 18.09 ක් හෙවත් සියයට 73 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.7** **ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම**

---

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා එකතුව රු.මිලියන 20 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 24.84 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 124.2 ක් වී තිබුණි. අදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** **10.03.07.06 දරන ආදායම් සංකේතය - ආදායම් ගිණුම**

---

i. මු.රෙ. 85(1)(ඇ) ප්‍රකාරව හැකිතාක් තාත්ත්වික හා නිවැරදි ලෙස තම ඇස්තමේන්තුව පිළියෙල නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ii. විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.150,000 ක ආදායම් 2015 වර්ෂයේ සිට හිඟහිට තිබුණි.

iii. මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

iv. මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානවලින් ලැබිය යුතු රු. 16,000 ක්, ආදායම් ගිණුමේ දක්වා නොතිබුණි.

v. ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම වැඩිවීම රු.මිලියන 2.037 ක් වී තිබුණි. 2017 ජුනි 15 දිනැති අංක 2023/15 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව අරඹන ලද නව ආදායම් ශීර්ෂ 4 ක් යටතේ ආනයනය, ආනයනය හා ප්‍රතිඅපනයන සහ වෙනත් ආනයන හා අපනයන වශයෙන් ආදායම් ලැබීම ආදායම් වැඩිවීමට හේතු වී තිබුණි.

vi. 2015 ජූලි 20 දිනැති අංක 1924/6 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් උපස්ථර මත මුහුදු ජීවී වගාව සඳහා කැලි 01 කට රු.100 ක ගාස්තුව රු.50 ක් ලෙස අඩුකර තිබීමත් බලපත්‍ර ගාස්තු වෙළඳපොළ වටිනාකමට තක්සේරු කර සාධාරණ වටිනාකමක් බලපත්‍ර ගාස්තු සඳහා නියම නොකිරීමත් නිසා ප්‍රමාණවත් ආදායමක් අහිමි වී තිබුණි.

vii. අජීවී බෙල්ලන් කවච (M2) ප්‍රවාහනය හා බලපත්‍ර ආදායම සමාලෝචිත වර්ෂයේ සිට භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය වෙත පවරා තිබීම නිසා රු.මිලියන 3.8 ක් ලෙස පසුගිය වර්ෂයේ ලැබී තිබුණු ආදායමක් සමාලෝචිත වර්ෂයේ දී අහිමි වී තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 290011 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 24 | 24 | 17 | 21.8 | 105 | 78 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 2,427,199 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 13 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ආ) ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර නොගැනීම**

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරු වී යන දෙපාර්තමේන්තුවට ලිඛිතව ලියා යවා අප්‍රමාදව එම නිලධාරියාගෙන් අයකර ගැනීමට අදාල දෙපාර්තමේන්තුව නිසිපරිදි සටහන් කරගත් බවට සනාථ කරගත යුතුය. එසේම එය විගණකාධිපති සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහෙත් නිරවුල් කර ගැනීමට ක්‍රියාකර නොතිබුණු නිලධාරීන් තිදෙනෙකුගේ එම ණය ශේෂය රු.352,510 ක් විය.

## 2.9 අග්‍රිම ගිණුම

-------------

දෙපාර්තමේන්තුව යටතේ වූ අග්‍රිම ගිණුම් 01 ක 2017 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු.මිලියන 1.78 ක් විය. මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව ලබාදෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් 2017 වර්ෂය තුළ ලබාදී තිබුණු විශේෂ සුළු මුදල් අත්තිකාරම් හා විශේෂ ඉන්ධන අත්තිකාරම් පියවීම ප්‍රමාද වී තිබූ අවස්ථා 39 ක් නිරීක්ෂණය විය.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගිය ද යාවත්කාලීන කර නොතිබුණි.

## 2.11 අභ්‍යන්තර විගණනය

---------------------

(අ) 2016 හා 2017 වර්ෂ සඳහා පිළිවෙලින් විගණන විමසුම් 09 හා 08 ක් නිකුත් කර තිබුණු අතර එයින් පිළිතුරු නොලද විගණන විමසුම් 02 ක් නිරීක්ෂණය විය.

(ආ) අනුමත සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුගේ පුරප්පාඩුවක් පැවතුණි.

(ඇ) 2009 ජුනි 09 දිනැති DMA/2009(1) අංක දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට ගිණුම් හා විගණනය පිළිබඳ දැනුම හා පුහුණුව ඇති ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

(ඈ) 2009 ඔක්තෝබර් 07 දිනැති කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(3) මඟින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර විගණන ප්‍රමිත 1210 ප්‍රකාරව නිලධාරීන්ට අභ්‍යන්තර විගණන කාර්යය සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

------------------------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අනුව පුරපුපාඩු සේවක සංඛ්‍යාව 324 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 336.07 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම වාර්ෂිකව රු.492,060 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 37 | 11 | - |
| (ii) | තෘතියික මට්ටම | 20 | 13 | 07 | - |
| (iii) | ද්විතියික මට්ටම | 831 | 544 | 287 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 88 | 19 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | එකතුව | 1006 | 683 | 324 | 01 |

## 2.13 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

-------------------------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වර්ෂය වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණි. ඊට ගැලපෙන පරිදි මෙම දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබා ගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ද හඳුනාගෙන නොතිබුණි.